# හවුල් ව්‍යාපාර නීතිය

## විෂය නිර්දේශය මත බර තැබීම - 10 %

### පාඩම් අන්තර්ගතය

- හවුල් ව්‍යාපාර නීතිය හැඳින්වීම
- හවුල්කරුවන් සහ තෙවන පාර්ශවය අතර ඇති සම්බන්ධතාවය
- හවුල්කරුවන් වෙනස් කිරීම
- හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම



# <u>හවුල් ව්‍යාපාර නීතිය හැඳින්වීම</u>

- හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් මෙරටදී ඉංග්‍රීසි නීතිය අදාල වන බව 1852 අංක 05 දරණ සිවිල් නීති ආඥා පනතේ 3 වගන්තියෙහි සඳහන් වේ.
- හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බලපාන ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතිය වන්නේ 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතයි. එයට අනුව **හවුල් ව්‍යාපාරයක් යනු**

**□□ ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් ව්‍යාපාරයක් පොදුවේ පවත්වාගෙන යාම සඳහා පුද්ගලයන් අතර පවතින සම්බන්ධතාවයකි. □□**

ඒ අනුව හවුල් ව්‍යාපාරයක් ඇති වීම සඳහා පහත කරුණු තෘප්ත විය යුතුය.

- පාර්ශවයන් අතර වලංගු එකඟතාවයක් තිබිය යුතුය.
- හවුල් ව්‍යාපාරය, ව්‍යාපාර කටයුත්තක් සඳහා විය යුතුය.
- හවුල්කරුවන් අතර පොදුවේ හවුල් ව්‍යාපාරය පවත්වා ගෙන යා යුතුය.
- ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් හවුල් ව්‍යාපාරය මෙහෙයවිය යුතුය.



# <u>හවුල් ව්‍යාපාරයක් අනිවාර්යයෙන්ම ලිඛිතව ඇති විය යුතුද ?</u>

- හවුල් ව්‍යාපාරයක් යනු ගිවිසුමකි.
- ඒ අනුව නීතියට අනුව වලංගු ලෙස ගිවිසුමක් ඇති විය හැකි සෑම ආකාරයකටම හවුල් ව්‍යාපාර ගිවිසුමක්ද ඇති විය හැකිය. එනම්,

  ➡ ලිඛිතව

  ➡ වාචිකව

  ➡ ව්‍යංගයෙන්

  යන ආකාර තුනටම හවුල් ව්‍යාපාර ගිවිසුමක්ද ඇති විය හැකිය. ඒ අනුව හවුල් ව්‍යාපාර ගිවිසුමක් ලිඛිතව ඇති විය යුතු වීම අනිවාර්ය නැත.

  ⇨⇨ එහෙත් 1840 අංක 7 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව හවුල් ව්‍යාපාරයක **ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දහස ඉක්මවන අවස්ථා වලදී එවන් හවුල් ව්‍යාපාරයක් අනිවාර්යයෙන් ලිඛිතව පැවතිය යුතුය.** ⇦⇦



# හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් ගණන

- 2007 අංක 7 දරණ සමාගම් පනතේ 519 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුල පුද්ගලයන් 20 කට වඩා වැඩි හවුල් ව්‍යාපාර තහනම් කෙරේ.

↳↳ ඒ අනුව මෙරටදී සාමාන්‍යයෙන් හවුල් ව්‍යාපාරයක සිටිය හැකි හවුල් කරුවන්ගේ සීමාව වන්නේ 2 - 20 අතර ප්‍රමාණයකි. ↵↵



# <u>හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම</u>

- 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත මගින් හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම පාලනය වේ. ( ඉහත පනතට 1987 අංක 07 දරන ව්‍යාපාර නාම පනත වශයෙන් සංශෝධනයක් සිදුකර තිබුනද තවම එම සංශෝධන පනත අක්‍රීයව පවතී. )
- යම් හවුල් ව්‍යාපාරයක් හවුල්කරුවන්ගේ සත්‍ය සම්පූර්ණ නාමයෙන් පවත්වාගෙන නොයන විට ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කල යුතුය.
- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචිය සඳහා මෙලෙස ප්‍රතිපාදන සලසා තිබීමේ අරමුණ නම්, හවුල් ව්‍යාපාරය සහ එහි යෙදී සිටින හවුල්කරුවන් පිලිබඳ තොරතුරු සම්බන්ධයෙන් මහජනතාවට දැනගැනීමට අවස්ථාවක් ලබා දීමයි.
- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචියේදී පහත සඳහන් කරුණු සඳහන් කල යුතුය.
    - ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය සහ ශාඛා ඇත්නම් ඒවායේ ලිපිනයන්
    - හවුල් ව්‍යාපාරයේ සාමාන්‍ය ස්වභාවය
    - එක් එක් හවුල්කරුවන්ගේ නම, ජාතිකත්වය, වාසස්ථාන ලිපිනය සහ වෘත්තිය


☝☝ ඉහත පරිදි ලියාපදිංචි කරන ලද විස්තර වල යම් වෙනසක් සිදු වුවහොත් එම වෙනස සිදුවූ දින සිට දින 30 ක් ඇතුලත ඒ පිලිබඳව ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා දැනුවත් කල යුතුය.



# හවුල් ව්‍යාපාරයකට නෛතික පුද්ගලභාවයක් තිබේද ?

- ඉහත පැනය සඳහා ලබා දිය හැකි සෘජු, නිශ්චිත, කෙටි පිලිතුර වන්නේ " නැත " යන්නයි.
- එනම්, හවුල් ව්‍යාපාරයක් යන්න නීතිය ඉදිරියේ වෙනමම පුද්ගලයෙකු ලෙස පිලි නොගනී.
- ඒ අනුව, යම් අධිකරණ ක්‍රියාදාමයකදී හවුල් ව්‍යාපාරය විසින් නඩු පැවරීම හෝ හවුල් ව්‍යාපාරයට එරෙහිව නඩු පවරනු ලැබීම සිදු කල යුත්තේ හවුල් ව්‍යාපාරයේ නමින් නොව, එම හවුල් ව්‍යාපාරයට සම්බන්ධ සියලුම හවුල්කරුවන්ගේ නම් වලිනි.

- තවද, සාමාන්‍ය හවුල් ව්‍යාපාරයක සියලුම හවුල්කරුවෝ එම හවුල් ව්‍යාපාරයේ සියලු බැරකම් සඳහා අසීමිතව වගකිව යුතු වෙති



# <u>හවුල් ව්‍යාපාරයක සාමූහික වගකීම</u>

- හවුල් ව්‍යාපාරයක යම් හවුල්කරුවෙකු විසින් සිදුකරනු ලබන සිවිල් වරදකදී

❒❒ එකී සිවිල් වරද සාමාන්‍ය හවුල් ව්‍යාපාර පරිචය තුල සිදුකර ඇත්නම්

හෝ

❒❒ එකී සිවිල් වරද සෙසු හවුල්කරුවන්ගේද අවසරය මත සිදුකර ඇත්නම්

ඒ සඳහා හවුල් ව්‍යාපාරය ( එනම් සෙසු හවුල්කරුවන්ද ) සාමූහිකවවත්, තනි තනිවවත් වගකීමට බැඳෙති.

**<u>හැම්ලින් එරෙහිව හූස්ටන්</u>**

H සහ S ධාන්‍ය වෙළෙන්දන් ලෙස හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන ගිය අතර වෙළඳ රහස් ලබාගැනීමේ අරමුණෙන් H විසින් වෙනත් සමාන්තර ව්‍යාපාරයක ලිපිකරුවෙකුට අල්ලසක් ලබා දීම හේතුවෙන් එම වෙනත් ව්‍යාපාරය බිඳ වැටුණි. සිවිල් වරදක් වන H ගේ මෙම ක්‍රියාව සඳහා, හවුල් ව්‍යාපාරයක සාමූහික වගකීම නැමැති සංකල්පයට අනුව S ද වගකිව යුතු බව අධිකරණය තීරණය කලේය.



# හවුල්කරුවන් අතර ඇති සම්බන්ධතාවය

- හවුල් ව්‍යාපාරයක් යනු ගිවිසුමකි. ඒ අනුව හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් තීරණය කල යුත්තේ අදාල හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුවය.
- යම් හවුල් ව්‍යාපාරයක් ලිඛිතව ඇත්නම් එලෙස හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් තීරණය කිරීම පහසුය.
- හවුල් ව්‍යාපාර ආඥා පනත මගින්ද ( එහි 24 වන වගන්තිය ) හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිලිබඳව විධිවිධාන සමහරක් දක්වා ඇත. **ඒවා අදාල කරගත යුත්තේ අදාල හවුල් ව්‍යාපාර ගිවිසුමට යටත්වය.**
- ලිඛිත හවුල් ව්‍යාපාර ගිවිසුම = හවුල් ව්‍යවස්ථාවලිය = හවුල් ඔප්පුව

# හවුල් ව්‍යාපාර ගිවිසුමට යටත්ව හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්

- සෑම හවුල්කරුවෙකුටම ප්‍රාග්ධනය පිලිබඳ සමාන අයිතියක් ඇති අතර ලාභ අලාභ සමසේ බෙදා ගත යුතුය.
- සෑම හවුල්කරුවෙකුම හවුල් ව්‍යාපාරයේ කලමනාකරණය වෙනුවෙන් සක්‍රියව සහභාගී විය යුතුය.
- කිසිම හවුල්කරුවෙකුට හවුල් ව්‍යාපාරයේ කලමනාකරණයට සහභාගී වීම වෙනුවෙන් වැටුප් ගෙවිය නොහැක.
- හවුල්කරුවන් විසින් යෙදූ ප්‍රාග්ධනය සඳහා ( ලාභය නිශ්චය කිරීමට ප්‍රථමයෙන් ) පොලී මුදලක් ලබාගැනීමේ හැකියාවක් කිසිදු හවුල්කරුවෙකුට නැත.
- හවුල්කරුවෙකු විසින් ප්‍රාග්ධනයට වැඩිමනත් මුදලක් අත්තිකාරම් ලෙස හවුල් ව්‍යාපාරය වෙත යොදවා ඇත්නම් ඒ සඳහා පොලියක් ලබා ගැනීමේ අයිතියක් එම හවුල්කරුවාට ඇත.
- හවුල් ව්‍යාපාරයේ කටයුතු අතරතුරදී හවුල්කරුවෙකු විසින් දරන ලද වියදම් හෝ වගකීම් ප්‍රතිපූර්ණය කරවා ගැනීමේ අයිතිවාසිකමක් සෑම හවුල්කරුවෙකුටම ඇත.

- හවුල් ව්‍යාපාරයේ පොත්පත් ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේම තබාගත යුතු අතර එම පොත්පත් පරීක්ෂා කර බැලීමට සෑම හවුල්කරුවකුටම අයිතියක් ඇත.
- හවුල් ව්‍යාපාරයට සම්බන්ධ ගනුදෙනු වලදී නිවැරදි ගිණුම් සහ සම්පූර්ණ තොරතුරු සෑම හවුල්කරුවෙකුටම ඉදිරිපත් කල යුතුය.
- හවුල් ව්‍යාපාරයට තරඟකාරී වන වෙනත් සමාන්තර ව්‍යාපාර පවත්වා නොගැනීමේ යුතුකමක් සෑම හවුල්කරුවෙකුටම ඇත.
- හවුල් ව්‍යාපාරයේ කටයුතු වලදී රහස් ලාභ ලබා නොගැනීමේ යුතුකමක් සෑම හවුල්කරුවෙකුටම ඇත. තවද හවුල් කරුවෙකු වෙත හවුල් ව්‍යාපාරික කටයුතු අතරේදී ලැබෙන යම් රහස් ලාභයක් පිලිබඳව හවුල් ව්‍යාපාරය වෙත එම හවුල්කරුවා විසින් අනාවරණය කල යුතුය. රහස් ලාභයක් යනු හවුල් ව්‍යාපාරික කටයුතු අතරේදී උපයන හෝ ලබන එහෙත් හවුල් ව්‍යාපාරය වෙත අනාවරණය නොකරනු ලබන ලාභයක්, වරප්‍රසාදයක් හෝ ත්‍යාගයක් වේ.
- **<u>බෙන්ට්ලි එරෙහිව ක්‍රේවන්</u>**

  B සහ C හවුල්කරුවන් වූ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් සීනි මිලදී ගැනීම සඳහා C ව යොදවා තිබුණි. C විසින් B ගේ අනුදැනුමකින් තොරව තමා විසින් අඩු මිලට මිලදී ගත් සීනි පසුව පවතින මිලට ( වැඩි මිලට ) හවුල් ව්‍යාපාරය වෙත ලබා දී විශාල ලාභයක් ඉපයීය. මෙය රහස් ලාභයක් බවත් C විසින් ඒ පිලිබඳව හවුල් ව්‍යාපාරය වෙත හේතු දැක්විය යුතු බවත් තීරණය විය.

- නව හවුල්කරුවෙකු හවුල් ව්‍යාපාරයට බඳවා ගැනීමේදී සෙසු සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත අවශ්‍ය වේ.

**<u>බ්‍රයින් එරෙහිව රීඩ්</u>**

B සහ R අතර පැවති හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි සඳහන් වූයේ B ගේ පුතා වන S ට වයස අවුරුදු 21 සපිරීමේදී S ව එහි හවුල්කරුවෙකු ලෙස බඳවා ගැනීමට B ට බලය ඇති බවයි. S අවුරුදු 21 ට එලඹීමේදී ඔහුව හවුල්කරුවෙකු ලෙස එම හවුල් ව්‍යාපාරය සඳහා බඳවා ගැනීමට B යෝජනා කලද R එම යෝජනාව ප්‍රතික්ෂේප කලේය.

අධිකරණය මෙහිදී තීරණය කලේ එම හවුල් ව්‍යාපාර ගිවිසුම ප්‍රකාරව R විසින් ඒ සඳහා කැමත්ත ලබා දී ඇති බැවින් මේ අවස්ථාවේදී එය වලක්වාලීමට R ට හැකියාවක් නොමැති බවයි.

- හවුල්කරුවෙකු ඉවත් කල හැක්කේ සෙසු සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත ඇතොත් පමණි.
- හවුල් ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කිරීම සඳහා සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත අවශ්‍ය වේ. එහෙත් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු පිලිබඳව හවුල්කරුවන්ගේ බහුතර මතය අනුව තීරණය කල හැක.

# හවුල්කරුවන් අතර නියෝජ්‍යත්වය

- නියෝජ්‍යත්ව නීතියට අනුව හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු යනු එම හවුල් ව්‍යාපාරයේ නියෝජිතයෙකු වන අතර සෙසු හවුල්කරුවන්ගේද නියෝජිතයෙක් වේ.

හවුල් ව්‍යාපාරය හෝ සෙසු හවුල්කරුවන් ⇨⇨⇨ ප්‍රධානියා

හවුල් ව්‍යාපාරය වෙනුවෙන් යම් කටයුත්තක් සිදු කරනු ලබන හවුල්කරු } ⇨⇨⇨ නියෝජිතයා

නියෝජිතයා විසින් නියෝජිත ධුරයේ කටයුතු කරන අවස්ථාවන් වලදී සිදු කරනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන් ප්‍රධානියා වගකීමට බැඳේ.

☒☒ ඒ අනුව, හවුල් ව්‍යාපාරයේ කටයුතු අතරතුරදී ඕනෑම හවුල්කරුවෙකු විසින් සිදු කරනු ලබන ක්‍රියාවකින් හවුල් ව්‍යාපාරය සහ සෙසු හවුල්කරුවන් වගකීමට බැඳෙති. ☒☒

# පහත අවස්ථා වලදී ඉහත රීතිය අදාල නොවේ.

- යම් ආකාරයකින් කටයුතු කරන හවුල්කරුවාට, හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ඒ ආකාරයෙන් කටයුතු කිරීමට බලයක් නොමැති විට සහ ඒ බව එම හවුල්කරුවා සමග ගනුදෙනු කල පුද්ගලයා දැන සිටින විට

- හවුල්කරු සමග ගනුදෙනු කල පුද්ගලයා විසින් අදාල හවුල්කරු , එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු බව නොදන්නා විට

# <u>හවුල්කරුවකු සතු ව්‍යංග අධිකාරී බලය</u>

- නියෝජ්‍යත්ව නීතියට අනුව නියෝජිතයා සතු අධිකාරී බලය එනම් ප්‍රධානියා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා නියෝජිතයෙකුට ලැබී ඇති බලය ආකාර තුනකි.
- ඒවා නම්, සත්‍ය අධිකාරී බලය, ව්‍යංග අධිකාරී බලය සහ දෘශ්‍යමාන හෝ ප්‍රදර්ශනශීලී අධිකාරී බලය යි.
- සෑම හවුල්කරුවෙකුම ස්වකීය හවුල් ව්‍යාපාරයේ නියෝජිතයෙකු වේ.
- ඒ අනුව යම් හවුල්කරුවෙකුට ඔහුගේ හවුල් ව්‍යාපාරය වෙනුවෙන් කටයුතු කිරීමට ව්‍යංග අධිකාරී බලයක් ඇතැයි සැලකෙන අවස්ථා ඇත. එම අවස්ථා වලදී එලෙස කටයුතු කරන හවුල්කරුවාගේ ක්‍රියාවන් සඳහා ප්‍රධානියා ලෙස හවුල් ව්‍යාපාරය වගකීමට බැඳේ.

එම අවස්ථා පහත පරිදි වේ

⇩⇩⇩⇩⇩

# හවුල්කරුවෙකු සතුව ව්‍යංග අධිකාරී බලයක් ඇතැයි සැලකෙන අවස්ථා

- හවුල් ව්‍යාපාරය වෙනුවෙන් භාණ්ඩ විකිණීම.
- හවුල් ව්‍යාපාරය වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීම.
- හවුල් ව්‍යාපාරයේ ණය ගැතියන් විසින් හවුල් ව්‍යාපාරය වෙත සිදු කරන ණය මුදල් ගෙවීම් භාර ගැනීම සහ ඒ වෙනුවෙන් ලදු පත් නිකුත් කිරීම.
- හවුල් ව්‍යාපාරයේ ණය ගැතියන් සම්බන්ධයෙන් නඩු පැවරීමට නීතිඥ වරයෙකුට උපදෙස් දීම.
- හවුල් ව්‍යාපාරය වෙනුවෙන් මුදල් ණයට ගැනීම සහ ඒ වෙනුවෙන් හවුල් ව්‍යාපාරයේ භාණ්ඩ ඇපයට තැබීම.
- හවුල් ව්‍යාපාරය වෙනුවෙන් සේවකයන් සේවයේ යෙදවීම.
- හවුල් ව්‍යාපාරයේ නාමයෙන් ගනුදෙනු කල හැකි ලේඛණ ( උදා - චෙක් පත් ) පිලියෙල කිරීම, නිකුත් කිරීම සහ ප්‍රතිග්‍රහණය කිරීම.

# හවුල්කරුවන් සහ තෙවන පාර්ශවය අතර ඇති සම්බන්ධතාවය

- යම් හවුල්කරුවෙකු, හවුල් ව්‍යාපාරයේ සාමාජිකයෙකුව සිටින කාලය තුලදී එම හවුල් ව්‍යාපාරය විසින් බාහිර පාර්ශවයක් වෙතින් ලබා ගෙන ඇති ණය මුදලක් සම්බන්ධයෙන් එම හවුල්කරුවා වගකිව යුතුය.
- යම් හවුල් ව්‍යාපාරයකට අලුතෙන් බැඳුණු හවුල්කරුවෙකු , ඔහු හවුල් ව්‍යාපාරයට බැදීමට පෙර හවුල් ව්‍යාපාරය විසින් බාහිර පාර්ශවයක් වෙතින් ලබා ගෙන ඇති ණය සම්බන්ධයෙන් වගකිව යුතු නැත.
- හවුල් ව්‍යාපාරයකින් විශ්‍රාම යන හෝ ඉල්ලා අස් වන හවුල්කරුවෙකු, ඔහු හවුල්කරුවෙකුව සිටි සමයේ, හවුල් ව්‍යාපාරය විසින් බාහිර පාර්ශවයක් වෙතින් ලබා ගෙන ඇති ණය සම්බන්ධයෙන් වගකිව යුතුය. එහෙත් විශ්‍රාම යන හවුල්කරුවාව එම වගකීම් වලින් නිදහස් කිරීමට අදාල ණය හිමියන් සහ සෙසු හවුල්කරුවන් එකඟ නම් ඉන් මිදීමට විශ්‍රාම යන හවුල්කරුට හැකියාව ඇත.

# හවුල්කරුවෙකු විශ්‍රාම යාමෙන් පසුව ලබා ගත් ණය සඳහා වගකීම

හවුල්කරුවෙකු විශ්‍රාම යාමට පෙර හවුල් ව්‍යාපාරය සමග **ගනුදෙනු කල බාහිර පාර්ශවයන්** වෙත තමාගේ ඉවත්වීම ( විශ්‍රාම ගැනීම ) පිලිබඳව දන්වා නොමැතිනම් ( එනම්, තමා තවදුරටත් එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු නොවන බව දන්වා නොමැති නම් ) ඔහු එලෙස විශ්‍රාම යාමෙන් පසුව පවා හවුල් ව්‍යාපාරය විසින් **එකී බාහිර පාර්ශවයක්** වෙතින් ලබාගත් ණය සම්බන්ධයෙන් එසේ ඉවත් වූ හවුල්කරු වගකිව යුතුය.

හවුල්කරුවෙකු විශ්‍රාම යාමට පෙර එම හවුල් ව්‍යාපාරය සමග **ගනුදෙනු නොකල, එහෙත් ඔහු හවුල්කරුවෙකු බව දැන සිටි බාහිර පාර්ශවයන්** වෙත තමාගේ ඉවත්වීම ( විශ්‍රාම ගැනීම ) පිලිබඳව දන්වා නොමැතිනම් ( එනම්, තමා තවදුරටත් එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු නොවන බව දන්වා නොමැති නම් ) ඔහු එලෙස විශ්‍රාම යාමෙන් පසුව පවා හවුල් ව්‍යාපාරය විසින් **එකී බාහිර පාර්ශවයක්** වෙතින් ලබාගත් ණය සම්බන්ධයෙන් එසේ ඉවත් වූ හවුල්කරු වගකිව යුතුය.

⇩⇩⇩⇩⇩

# හවුල්කරුවෙකු විශ්‍රාම යාමෙන් පසුව ලබා ගත් ණය සඳහා වගකීම

- යම් හවුල්කරුවෙකු විශ්‍රාම යාමට පෙර **හවුල් ව්‍යාපාරය සමග ගනුදෙනු නොකල සහ එලෙස විශ්‍රාම යන පුද්ගලයා එම හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකුව සිටි බව නොදන්නා බාහිර පාර්ශවයක්** වෙතින් යම් හවුල්කරුවෙකු විශ්‍රාම ගිය පසුව හවුල් ව්‍යාපාරය විසින් ලබා ගන්නා ලද ණය සම්බන්ධයෙන් එලෙස විශ්‍රාම ගිය හවුල්කරු වගකීමට නොබැඳේ.

- ☹☹☹ ඒ අනුව, හවුල් ව්‍යාපාරයකින් විශ්‍රාම ගන්නා හවුල්කරුවෙකු, ඔහුගේ විශ්‍රාම යාම පිලිබඳව දන්වා නොමැති නම්, **ඔහු එහි හවුල්කරුවෙකු බව දැන සිටි සහ ඔහු එහි හවුල්කරුවෙකුව සිටි කාලයේ එම හවුල් ව්‍යාපාරය සමග ගනුදෙනු කල , නොකල සියලුම බාහිර පාර්ශවයන් වෙතින් ඔහු එම හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වු පසුව, එම හවුල් ව්‍යාපාරය විසින් ලබාගත් ණය සඳහා වගකිව යුතුය. ☹☹☹**

## ටවර් කැබිනට් සමාගම එරෙහිව ඉන්ග්‍රම්

C සහ I අතර පැවති හවුල් ව්‍යාපාරය විසිරුවා හැරිය නමුත් ඒ පිලිබඳව දැන්වීමක් පල නොකරන ලදී. පසුව C විසින් තමා හවුල්කරුවෙකු බව දැක්වෙන හවුල් ව්‍යාපාරයේ පැරණි ලිපි ශීර්ෂ භාවිතා කරමින් T ගෙන් භාණ්ඩ ණයට ලබා ගනී. I , එහි හවුල්කරුවෙකුව සිටි බව T නොදනී.

අධිකරණය තීරණය කලේ එම ගනුදෙනුව සඳහා I විසින් T වෙත වගකිව යුතු නැති බවයි.

# <u>හවුල්කරුවෙකු මියයාම හෝ වස්තු භංගත්වයට පත්වීම.</u>

- යම් හවුල් ව්‍යාපාරයක නිරතව සිටි හවුල්කරුවෙකුගේ මරණයෙන් හෝ වස්තු භංගත්වයට පත්වූ දිනෙන් පසුව හවුල් ව්‍යාපාරය විසින් බාහිර පාර්ශවයක් වෙතින් ලබා ගත් ණය සම්බන්ධයෙන්

⇩⇩

මියගිය හෝ වස්තු භංගත්වයට පත් හවුල්කරුගේ බූදලය / දේපල

**<u>වගකීමට නොබැඳේ.</u>**

# හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම.

- හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම පහත දෙයාකාරයටම සිදු විය හැකිය
  - අධිකරණ නියෝගයක් මත විසුරුවා හැරීම
  - අධිකරණ නියෝගයක් රහිතව විසුරුවා හැරීම

# <u>අධිකරණ නියෝගයක් මත හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිය හැකි අවස්ථා</u>

- යම් හවුල්කරුවෙකු, හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ස්වකීය යුතුකම් ඉටු කල නොහැකි ලෙස පූර්ණ ආබාධිත තත්වයට පත් වීම.
- මානසික රෝගී තත්වයක් නිසා යම් හවුල්කරුවෙකුට හවුල් ව්‍යාපාරයේ කටයුතු කලමනාකරණය කිරීමට නොහැකි වීම.
- එක් හවුල්කරුවෙකු විසින් හවුල් ව්‍යාපාර ගිවිසුම බරපතල ලෙස උල්ලංගනය කර ඇති විට.
- යම් හවුල්කරුවෙකුගේ හැසිරීම හවුල් ව්‍යාපාරයේ පැවැත්මට අගතිදායී වන විට. උදාහරණ - **<u>කාම්වෙල් එරෙහිව එවෑන්ස් නඩුව</u>**

  මෙහිදී එක් හවුල්කරුවෙකු විසින් දුම්රියක ප්‍රවේශ පත්‍රයක් නොමැතිව ගමන් කිරීමේ වරදට වරදකරුවෙකු වී තිබුණ අතර ඔහු එම වරදට දඬුවම් ලබා තිබීම හවුල් ව්‍යාපාරයේ පැවැත්මට හානිදායක වන බැවින් එම හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම යෝග්‍ය බව අධිකරණය තීරණය කලේය.

# අධිකරණ නියෝගයක් මත හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිය හැකි අවස්ථා ( ඉතිරිය )

- හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යා හැක්කේ පාඩු පිට පමණක් වන අවස්ථාවකදී
- හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම සාධාරණ සහ යුක්ති සහගත යැයි අධිකරණයට හැගෙන වෙනත් ඕනෑම අවස්ථාවකදී

**Re Yenidje Tobacco Co. Ltd**

හවුල්කරුවන් දෙදෙනා අතර ඇතිවූ අමනාපයක් නිසා හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමේ නියෝගයක් ලබා දිම සාදාරණ සහ යුත්කි සහගත බව අධිකරණය මෙහිදී තීරණය කලේය.

# අධිකරණ නියෝගයක් නොමැතිව හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිය හැකි අවස්ථා ( හවුල්කරුවන්ගේ ස්වේච්ඡාවෙන් )

- යම් නිශ්චිත කාලයක් සඳහා හවුල් ව්‍යාපාරය ආරම්භ කලේ නම් එම කාලය නිමා වීමෙන්
- යම් නිශ්චිත කාර්යක් සඳහා හවුල් ව්‍යාපාරය ආරම්භ කලේ නම් එම කාර්ය නිමා වීමෙන්
- එක් හවුල්කරුවෙකු විසින් සෙසු හවුල්කරුවන් වෙත හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම පිලිබඳව යෝජනා කර ඇති විට සහ සෙසු හවුල්කරුවන් සියලුම දෙනා ඊට එකඟවී ඇති විට
- හවුල්කරුවන් අතර ඇති යම් එකඟතාවයකට යටත්ව එක් හවුල්කරුවෙකු මියගිය විට හෝ වස්තු භංගත්වයට පත්වූ විට
- එක් හවුල්කරුවෙකුගේ කොටස එම හවුල්කරුවාගේ පුද්ගලික ණය වෙනුවෙන් බැඳී ඇති විට
- හවුල් ව්‍යාපාරය පසු අවස්ථාවකදී නීති විරෝධී වූ විට

# <u>මෙරට හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාල වන පනත් කිහිපයක්</u>

- 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත
- 1852 අංක 05 දරණ සිවිල් නීති ආඥා පනත
- 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත
- 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත
- 1953 වස්තු භංගත්ව පනත
- දේශීය ආදායම් පනත
- සිවිල් නඩු විධාන සංග්‍රහය
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- 1907 සීමිත හවුල් ආඥා පනත
- හවුල් ව්‍යාපාරයේ ස්වභාවය අනුව අදාල වන වෙනත් පනත්. උදා -
- පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය පනත, ආහාර පනත ආදිය.

# හවුල් ඔප්පුවක අඩංගු කරුණු

- හවුල් ව්‍යාපාරයේ නම
- හවුල්කරුවන්ගේ නම් සහ ලිපිනයන්
- හවුල් ව්‍යාපාරයේ ස්වභාවය
- හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
- එක් එක් හවුල්කරු විසින් යොදන ලද ප්‍රාග්ධනය
- ප්‍රාග්ධනයට පොලිය ගෙවන්නේ නම් ඒ කෙසේද ?
- හවුල්කරුවන්ට වැටුප් ගෙවන්නේ නම් ඒ කෙසේද ?
- හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ විභජනය කරන ආකාරය
- හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අතිරේඛව යෙදූ මුදල් සඳහා පොලිය ගෙවන ආකාරය
- හවුල් ව්‍යාපාරයේ කටයුතු කළමනාකරණය කරන ආකාරය
- හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා වූ කොන්දේසි

- හවුල් ව්‍යාපාරයේ ගිණුම් තබන ආකාරය
- හවුල් ව්‍යාපාරය තුල ඇතිවිය හැකි ආරවුල් විසඳා ගන්නා ආකාරය
- හවුල් ව්‍යාපාරයේ ගිණුම් තබන ආකාරය
- හවුල්කරුවකු බඳවා ගැනීම සහ විශ්‍රාම යාම පිලිබඳ විධාන
- හවුල් ව්‍යාපාරය විසුරුවා හරින ආකාරය

# සටහන්

# සටහන්